# DAC ඇගයීමේ නිර්ණායක

## තිරසාරභාවය

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දදායකයින්ට වඩාත් සමීප හා කාර්යක්ෂම නියෝජිතයන් වීමට ඔබ කැමැත්තක් දක්වන්නේද?

ඔබේ ඡන්දදායකයන් නියෝජනය කරමින් පාර්ලිමේන්තු විවාදවලදී නිසි ප්‍රශ්න මතු කරමින් රටේ සංවර්ධනය උපරිම කිරීමට හා එහි ප්‍රතිඵල ඔවුන්ට ලබාදීමට ඔබ උනන්දුවක් දක්වන්නේද?

එසේ නම් ඇගයීම පිළිබඳ **OECD DAC** නිර්ණායක ඔබට ප්‍රයෝජනවත් වියහැක. ඒ සඳහා මෙම කෙටි පත්‍රිකා මාලාව කියවන්න.

**ඇගයීම් පිළිබඳ ආසියා පැසිෆික් කලාපයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදය**

## හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකහරය වන්නේ පාර්ලිමේන්තුව තුලින් වගවීම, විනිවිදභාවය හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. නීති සම්පාදනයේ ප්‍රමුඛයින් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රටේ සංවර්ධනයේ ප්‍රධාන කොටස්කරුවන්ය. පාර්ලිමේන්තු විවාදවලදී සංවර්ධන වැඩසටහන් පිළිබඳව හරවත් ප්‍රශ්න ඇසීම මගින් ඇගයීම් වලින් ලබාගන්නා තොරතුරු භාවිතා කිරීමෙන්, තිරසාර සංවර්ධනය සඳහා ජාතික ක්‍රියාවලියෙන් සම්පත් වෙන්කිරීමේදී පාර්ළිමේන්තු මන්ත්‍රීවරුන්ට මෙම ක්‍රියාවලියට දායකවිය හැකිය.

සංවර්ධනය සඳහා වන මැදිහත්වීම් පිළිබඳ මනා අවබෝධය සමග ඒකාබද්ධ වූ OECD/DAC ඇගයීම් නිර්ණායක පුරවැසියන් සඳහා උපරිම ප්‍රතිලාභ සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තු විවාද සහ ආයෝජන කමිටු රැස්වීම්වලදී හරවත් ප්‍රශ්න ඇසීමට සහාය විය හැකිය.

මෙම පත්‍රිකා මාලාව තුලින් OECD/DAC නිර්ණායක හය පිළිබඳව විස්තර කරනු ලබයි.

## තිරසාරභාවය

තිරසාරභාවය පිළිබඳ OECD/DAC නිර්වචනය මගින් ඉදිරිපත්වන ප්‍රධාන ගැටලුව වන්නේ ප්‍රතිලාභ දීර්ඝකාලීනව නොනැසී පවතිනු ඇතිද යන්නයි.

තිරසාරභාවය යනු සංවර්ධන වැඩසටහන්වල ශුද්ධ ප්‍රතිලාභ සංවර්ධන වැඩසටහන් පවතින කාලයෙන් ඔබ්බට ගොස් අඛණ්ඩව පැවතීම හෝ අඛණ්ඩව පැවතීමට ඉඩපවතින ප්‍රමාණයයි.

ප්‍රතිපත්තියක හෝ ව්‍යාපෘතියක තිරසාරභාවය පිළිබඳ තක්සේරු කිරීම සඳහා කාලයත් සමග ශුද්ධ ප්‍රතිලාභ ලබා ගැනීමට අවශ්‍ය පද්ධතිවල මූල්‍ය, ආර්ථික, සමාජීය, පාරිසරික සහ ආයතනික ශක්‍යතාවන් පරීක්ෂා කල යුතුය. යමකට ඔරොත්තුදීමේ හැකියාව, අවදානම් සහ විභව ගැළපුම් පිළිබඳ විශ්ලේෂණයන් එයට අන්තර්ගත වේ. ඇගයීමේ කාලය මත පදනම්ව, ලඟාකරගන්නා වූ බලපෑම් හෝ ඉදිරියේදී ලඟාකරගත හැකි බලපෑම් විශ්ලේෂණය කිරීම මෙයට අන්තර්ගතවේ.

### ඇගයීමේ නිර්ණායක

**උචිතබව**
සංවර්ධන වැඩසටහන
නිවැරදි දේ සිදු කරන්නේද?

**සඵලතාව**
සංවර්ධන වැඩසටහන
එහි අරමුණු ළඟා කරගන්නේද?

**බලපෑම**
සංවර්ධන වැඩසටහන
කිනම් වෙනසක් ඇති කරන්නේද?

**ඒකාබද්ධභාවය**
සංවර්ධන වැඩසටහන
කොතරම් දුරට යෝග්‍ය වන්නේද?

**කාර්යක්ෂමතාව**
සම්පත් කොතරම්
දුරට භාවිත වන්නේද?

**තිරසාරභාවය**
ප්‍රතිලාභ දීර්ඝ
කාලීනව පවතින්නේද?

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිරසාරභාවය පිළිබඳ නිර්ණායක භාවිත කළ හැකි ආකාරය

ජනතාව සඳහා දීර්ඝකාලීන ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් සංවර්ධන වැඩසටහන් සඳහා සම්පත් වෙන්කරන අයවැය පාර්ලිමේන්තු විසින් අනුමත කරනු ලැබේ. මෙමගින් යටිතල පහසුකම් සංවර්ධනය, දරිද්‍රතාවය තුරන්කිරීම, පරිසර සංරක්ෂණය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා සම්පත් වෙන් කළ හැක.

ප්‍රාග්ධනය දැඩිව අවශ්‍යවන යටිතල පහසුකම් යටතේ විසඳුම් ලබාදෙන ගැටලු කෙටි කාලීනව පමණක් නොව දීර්ඝකාලීනව විසඳා ගැනීම වැදගත් වේ. නිදසුනක් වශයෙන්, නව මාර්ග පද්ධතියක් අද පමණක් නොව, ඉදිරි වසරවල් සඳහාද ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් ධාරිතාවක් සැපයිය යුතුය. ප්‍රතිලාභ සැබවින්ම තිරසාරවීමට නම්, මාර්ගය පවතින කාලය පුරාම එහි නඩත්තු වියදම් පියවාගැනීමේ යාන්ත්‍රණයක්ද අපට අවශ්‍ය වේ.

ජනතාවගේ හැසිරීම් රටාවල වෙනස්කම්වලට අනුබලදීම හරහා ඔවුන්ගේ ජීවන ප්‍රතිඵල වැඩිදියුණු කරන සෞඛ්‍ය වැඩසටහනක් තුළ, මෙම චර්යා වෙනස්වීම් තාවකාලික නොව ස්ථිරවීම වැදගත් වේ. නිදසුනක් වශයෙන්, මව්වරුන් තම ළදරුවන්ට ආහාර ලබාදෙන ආකාරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපාරයක දී, ව්‍යාපාරයේ කාලසීමාව තුළ පමණක් නොව, ඉදිරියටත් මව්වරුන් ළදරුවන් සඳහා පෝෂ්‍යදායී ආහාර ද්‍රව්‍ය තෝරා ගැනීම වැදගත් වේ.

තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා, මෙම සංවර්ධන වැඩසටහන් හා සම්බන්ධ වන පුද්ගලයන් අතර ආකල්ප සහ හැසිරීම්වල ස්ථිර වෙනස්කම් මෙන්ම අප අත්කර ගැනීමට උත්සාහ කරන සංවර්ධන වෙනස සඳහා සහාය වන ප්‍රධාන ආයතන සහ පද්ධති තුළ පවතින ධාරිතාවය අපි නිතර තහවුරු කළ යුත්තෙමු. එහි ස්වභාවය අනුව, සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක වන කාලය තුළ එහි තිරසාරභාවය තක්සේරු කිරීම දුෂ්කර කටයුත්තකි. තිරසාරභාවය සත්‍ය වශයෙන්ම තක්සේරු කිරීම සඳහා, වැඩසටහන හෝ ප්‍රතිපත්තිය ආරම්භ කිරීමෙන් බොහෝ කලකට පසුව අප සංවර්ධන වැඩසටහන් තක්සේරු කිරීම අවශ්‍ය වේ.

තිරසාරභාවය පිළිබඳ නිර්ණායක පිළිබඳ අවබෝධය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වත්මන් පාර්ලිමේන්තු ක්‍රමය සඳහා පමණක් නොව, රජයේ වියදම්වලින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ කාලයත් සමග අඛණ්ඩව පවතිනු ඇති ප්‍රමාණය පිළිබඳව විවාද සභාගර්භය තුළ සහ පාර්ලිමේන්තු කමිටු තුළ අදාළ ප්‍රශ්න ඇසීමට දායක වේ.

ජනතාව සඳහා දීර්ඝකාලීන ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් සංවර්ධන වැඩසටහන් සඳහා සම්පත් වෙන්කරන අයවැය පාර්ලිමේන්තු විසින් අනුමත කරනු ලැබේ. මෙමගින් යටිතල පහසුකම් සංවර්ධනය, දරිද්‍රතාවය තුරන්කිරීම, පරිසර සංරක්ෂණය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා සම්පත් වෙන් කළ හැක.

## තිරසාරභාවය සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඇසිය හැකි ප්‍රශ්න

සංවර්ධන වැඩසටහනක්, ව්‍යාපෘතියක් හෝ ප්‍රතිපත්තියක තිරසාරභාවය පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විසින් ඇසිය හැකි ප්‍රශ්න සඳහා නිදසුන් පහත දැක්වේ. කෙසේ වෙතත්, ප්‍රශ්න ඇසීමේදී නිර්මාණශීලීවීම, රටේ සන්දර්භය සැලකිල්ලට ගැනීම, සංවර්ධන වැඩසටහන් හෝ ප්‍රතිපත්තියේ ස්වභාවය සහ විවාදයේ සහ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේ අවශ්‍යතා සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

අ: සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය, සමාජීය, ආර්ථික සහ පාරිසරික ශුද්ධ ප්‍රතිලාභ මොනවාද?

ආ: කාලයත් සමග මෙම ශුද්ධ ප්‍රතිලාභ තිරසාර ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය ආයතන සහ පද්ධතිවල හැකියාවන් මොනවාද?

ඇ: ප්‍රතිලාභ ස්ථිරවීමට අවශ්‍ය ආකල්ප සහ හැසිරීම්වල වැදගත් වෙනස්කම් තිබේද? ඒවා ප්‍රදර්ශනය කිරීමට කුමන පාර්ශවකරුවන් හමුවිය යුතුද?

ඈ: මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන ප්‍රතිලාභ අඛණ්ඩව පවත්වාගෙන යාමට පහසුකම් සපයන හෝ අවම කරන වෙනත් සාධක මොනවාද?

ඉ: පරිසරයේ වෙනස්වීම් සඳහා ප්‍රධාන ධාරිතාවන් සහ පද්ධති කෙතරම් දුරට ඔරොත්තු දෙනවාද?

ඊ: සංවර්ධන වැඩසටහන් සිදු කර ඇති ගනුදෙනු මොනවාද සහ ශුද්ධ ප්‍රතිලාභ සඳහා සිදුකෙරෙන යෝජනා මොනවාද?

***Source: De Silva,S.(2021).Theory of Change For Development Success: Workbook. Colombo, Sri Lanka: Sri Lanka Evaluation Association***

## තිරසාරභාවය පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීමට අවශ්‍ය මූලාශ්‍ර

OECD evaluation criteria, retrieved from
*https://tinyurl.com/2p9835a6*

OECD (2022) Understanding the six criteria: Definitions, elements for analysis and key challenges. retrieved from
*https://tinyurl.com/bddeffx8*

**ප්‍රකාශනය**

ASIA PACIFIC PARLIAMENTARIANS FORUM FOR EVALUATION

APEA Asia-Pacific Evaluation Association

Global Parliamentarians Forum for Evaluation

**විමසීම්:** apea.coordinator@gmail.com

**සිංහල පරිවර්තනය**

SLEvA
Sri Lanka Evaluation Association

**විමසීම්:** sleva.sec@gmail.com